# 21 වන දවස

## ඔබවහන්සේගේ කැමැත්ත ඉටුවේවා !
## ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද එසේ ම වේවා !

''දෙවියන් වහන්සේගේ මැවිල්ලේ අරමුණ අඛණ්ඩව පවත්වාගෙන යනුයේ ශ්‍රමයෙන් ය, වැඩ කිරීමෙන් ය. මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගැනීමට මැවිල්ල තුළ වූ සම්පත් සියල්ල සොයා ගත යුතු ය. මනුෂ්‍ය වර්ගයාගේ භාවිතය සඳහා ඒවා ඉදිරිපත් කරන්න. එසේ කිරීමෙන් ශ්‍රමයේ පරමාර්ථය මුදුන් පත් කරන්න. ශ්‍රමය නොමැතිව කිසිවක් නොමැත්තේ ය. සදාචාරාත්මක වේවා, මානසික වේවා, අධ්‍යාත්මික වේවා කිසිවක් නොමැත්තේ ය. ශ්‍රමය නැති තැන දෙවියන් වහන්සේගේ රාජ්‍යයක් ද නොමැත්තේ ය. එසේ හෙයින් ශ්‍රමය උතුම් කොට තකා එය ගරුත්වයකින් හා යුක්ති යුක්තව සලකන්න. තමා වැඩ කරන ස්ථානය පූජාසනයක් සේ ය. ඒ මත ගිහි පූජකත්වය දිව්‍ය පූජා යාගය තවදුරටත් ඔප්පු කරගෙන යන්නේ ය. (කාදිනල් කාර්ඩයින්තුමා)

ශුද්ධවන්තකම යනු දේව කැමැත්ත තුළ ජීවත් වීමයි. ශුද්ධවන්තවීම හැම දෙනාගේ ම කටයුත්තක්. සාමාන්‍ය ජීවිතයේ එදිනෙදා යුතුකම් ඉටුකිරීමෙහිලා ජීවිතාන්තය දක්වා මෙලොව ස්ථිරව පැවතීමෙන් ය එය මුදුන්පත් කරගනු ලැබිය හැකි වනුයේ. ක්‍රිස්තුන් වහන්සේ මෙසේ පවසන සේක. **''ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නා මිස මට ස්වාමිනි ස්වාමිනි කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෝ ය''** (ශු. මතෙව් 7:21).

ක්‍රියාකාරි ශුද්ධවන්තකම තුළ පහත කරුණු අඩංගු විය යුතු ය.

- ශුද්ධ ලියවිල්ල පණිවුඩයට සිය කැමැත්තෙන් සවන් දීම.
- ජන වන්දනාවේ සක්‍රමේන්තු ලබා ගැනීම. විශේෂයෙන් දිව්‍ය පූජාව.
- යාච්ඤාවේ හා ආත්ම පරිත්‍යාගයට යොමුව.
- තම අසල්වැසියාට, සමාජයට ක්‍රියාකාරි ලෙස සේවය කිරීම.
- සියලු ගුණ ධර්ම තුළ ජීවත් වීමට වෙර දැරීම.
- දෙවියන් වහන්සේට හා අසල්වැසියාට ප්‍රේම කිරීම වේ.

(ජාතීන්ගේ ආලෝකය දෙවන වතිකානු ප්‍රකාශනය 5 වන පරිච්ඡේදය)

**දවස පුරා :-** ✵ ඉහත ලක්ෂණ මගේ ජීවිතය තුළ ප්‍රායෝගික වී ඇති අන්දම ගැන අවදි වෙමු.
✵ ශු. මතෙව් 20:1-16
✵ පුබුදු ගීතාංජලී ගී අංක 219